සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



10 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය ................................ සංයුක්ත ගණිතය II කාලය පැය තුනයි

**උපදෙස්**

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.
  **A** කොටස (ප්‍රශ්න 1-10) දක්වා B කොටස (ප්‍රශ්න 11-17)
- **A කොටස**
  **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ පිළිතුරු සපයා ඇති ඉඩෙහි ලියන්න.
  **වැඩිපුර** ඉඩ අවශ්‍ය වේ නම් ඔබට අමතර ලියන කඩදාසි භාවිත කළ හැකිය.
- **B කොටස**
  **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- **නියමිත කාලය** අවසන් වූ පසු A කොටස B කොටසට උඩින් සිටින පරිදි කොටස් දෙක අමුණා විභාග ශාලාධිපතිට **භාර දෙන්න.**
- **ප්‍රශ්න පත්‍රයෙහි** B කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙනයාමට ඔබට අවසර ඇත.

---

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| සංයුක්ත ගණිතය II | | |
|---|---|---|
| කොටස | ප්‍රශ්න අංකය | ලකුණු |
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| B | එකතුව | |
| | 11 | |
| | 12 | |
| | 13 | |
| | 14 | |
| | 15 | |
| | 16 | |
| | 17 | |
| | එකතුව | |
| මුළු එකතුව | | |
| ප්‍රතිශතය | | |

| | |
|---|---|
| පත්‍රය I | |
| පත්‍රය II | |
| එකතුව | |
| අවසාන ලකුණු | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | | |
|---|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | | |
| පරීක්ෂා කළේ | 1 | |
| | 2 | |
| අධීක්ෂණය | | |

## (A කොටස)

1) විශාලත්වය $P$ හා $2P$ වන බල දෙකක සම්ප්‍රයුක්ත බලය $\sqrt{3}\,P$ වේ. එම බල දෙක අතර කෝණය සොයන්න. සම්ප්‍රයුක්ත බලය හා පළමු බලය අතර කෝණය සොයන්න.

2) තිරසට $30^0$ ක කෝණයකින් ආනත සුමට අචල තලයක් මත ඇති ස්කන්ධය $5\,kg$ වූ ලක්ෂ්‍යයාකාර වස්තුවක් සමතුලිතව තැබීම සඳහා ආනත තලයට සමාන්තරව යෙදිය යුතු බලයේ අගය ද ආනත තලය හා වස්තුව අතර ප්‍රතික්‍රියාව ද සොයන්න.

3) $O$ අචල ලක්ෂ්‍යයක් අනුබද්ධයෙන් $A, B$ හා $C$ ලක්ෂ්‍ය වල පිහිටුම් දෛශික පිළිවෙලින් $\underline{a}$ , $\underline{b}$ හා $\underline{c}$ වේ. $3\underline{a} + 5\underline{b} = 8\underline{c}$ නම්, $A, B$ හා $C$ ලක්ෂ්‍ය ඒක රේඛීය වන බව පෙන්වන්න. $AC : CB$ අනුපාතය සොයන්න.

4) $6N$ බර අංශුවක් සැහැල්ලු තන්තු දෙකක් මගින් එල්ලෙමින් සමතුලිතව තිබේ. තන්තුවල ආතති $3N, 3\sqrt{3}\,N$ වේ නම් තන්තු දෙක සිරස සමඟ සාදන කෝණ සොයන්න.

5) අවකාශයේ වූ $O$ ලක්ෂ්‍යයක සිට $P$ අංශුවක් $2u$ ප්‍රවේගයෙන් සිරස්ව ඉහළට ප්‍රක්ශේපණය කරනු ලැබේ. එම මොහොතේම $O$ ලක්ෂ්‍යයේ සිට $Q$ අංශුවක් $u$ ප්‍රවේගයෙන් සිරස්ව පහළට ප්‍රක්ෂේපණය කරනු ලැබේ. අංශු දෙකම ගුරුත්වය යටතේ චලිත වේ. $P$ හා $Q$ අංශුවල චලිත සඳහා ප්‍රවේග කාල ප්‍රස්ථාර එකම රූප සටහනක ඇඳ $P$ අංශුව එහි උරිම උසට ළඟා වන විට $Q$ අංශුවේ ප්‍රවේගය $3u$ වන බව පෙන්වන්න.

6) පොළොව මත වූ $O$ ලක්ෂ්‍යයක සිය සිරස්ව ඉහළට ප්‍රක්ෂේපණය කළ අංශුවක් $h$ සිරස් උසකින් වූ ලක්ෂ්‍යයක් පසුකර ඉහළට හා පහළට චලනය වීමට ගතවන කාලයන් $t_1$ හා $t_2$ නම්, $h = \frac{1}{2}gt_1t_2$ බව පෙන්වන්න.

7) $\underline{a}$ හා $\underline{b}$ යනු ඒකක දෛශික දෙකක් වන අතර දෛශික දෙක අතර කෝණය $\theta$ වේ. $\sin\frac{\theta}{2} = \frac{1}{2}\left|\underline{a} - \underline{b}\right|$ බව පෙන්වන්න.

8) ස්කන්ධය $4kg$ හා දිග $24m$ වූ ඒකාකාර නොවූ දණ්ඩක දෙකෙළවර $A$ හා $B$ වේ. එකිනෙකට $8m$ ඇතින් පිහිටි පිහි තුඩු දෙකක් මත දණ්ඩ තිරස්ව සමතුලිතව ඇත්තේ $A$ සිට කිට්ටුම පිහිතුඩට ඇති දුර $4m$ වන සේය. දණ්ඩේ $B$ කෙළවරින් $6N$ ක බරක් එල්ලූ විට පිහි තුඩු මගින් දණ්ඩ මත යෙදෙන ප්‍රතික්‍රියා එක හා සමාන වේ. දණ්ඩ මත ඇතිවන ප්‍රතික්‍රියාවල විශාලත්ව සොයන්න. දණ්ඩේ ගුරුත්ව කේන්ද්‍රයට $A$ සිට ඇති දුර ද සොයන්න.

9) $-4\underline{i}+3\underline{j}$ , $6\underline{i}-7\underline{j}$ , $-2\underline{i}+4\underline{j}$ වූ බල පිළිවෙලින් $2\underline{i}-\underline{j}$ , $-3\underline{i}+\underline{j}$ , $4\underline{j}$ ලක්ෂ්‍ය වලදී ක්‍රියා කරයි. බල පද්ධතිය යුග්මයකට ඌණනය වන බව පෙන්වා යුග්මයේ විශාලත්වය සොයන්න.

10) එකම සරල රේඛීය මාර්ගයක එකිනෙක දෙසට ළඟාවන මෝටර් රථ දෙකක් $v$ හා $u$ ඒකාකාර ප්‍රවේගවලින් ගමන් කරයි. මෝටර් රථ දෙක අතර පරතරය $d$ වූ විට මෝටර් රථ දෙක ගැටෙන බව වැටහීමෙන් රථ දෙකම එකම අවස්ථාවේ තිරිංග තද කිරීම හේතුවෙන් පිළිවෙලින් $f_1$ හා $f_2$ මන්දනයන් රථ දෙකට ලැබී ගැටුම යන්තමින් වළක්වා ගනී. චලිතය සඳහා ප්‍රවේග කාල ප්‍රස්ථාරය අඳින්න. $d = \frac{u^2}{2f_2}+\frac{v^2}{2f_1}$ බව පෙන්වන්න.

## සංයුක්ත ගණිතය 12 - II (B කොටස)

<u>ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.</u>

11) a) $40\ kmh^{-1}$ ක ප්‍රවේගයෙන් $A$ නම් දුම්රිය ස්ථානයක් පසු කර දුම්රියක් $7\ km$ ක දුරක් එම ප්‍රවේගයෙන්ම ගමන් කර $A$ ට $8.5\ km$ දුරින් වූ $B$ දුම්රිය ස්ථානයේ දී නැවැත්වීම සඳහා ඒකාකාර මන්දනයකින් ගමන් කරයි. පළමු දුම්රිය $A$ දුම්රිය ස්ථානය පසුකරනවාත් සමඟම දෙවෙනි දුම්රියක් $A$ සිට නිශ්චලතාවයෙන් ගමන් අරඹා ඒකාකාර ත්වරණයකින් ගමන් කර අනතුරුව ඒකාකකාර මන්දනයක් යටතේ පළමු දුම්රිය $B$ වෙත ළඟාවනවාත් සමඟම $B$ දුම්රියපළට ළඟා වේ.

(i) ගමන සඳහාගත වූ මුළු කාලය සොයන්න.

(ii) දෙවෙනි දුම්රිය ලබාගත් උපරිම ප්‍රවේගය සොයන්න.

b) $t = 0$ අවස්ථාවේදී නිශ්චලතාවයෙන් ආරම්භ වන $x$ නම් මෝටර් රථයක් $f$ ඒකාකාකර ත්වරණයකින් චලනය වේ. $t = T$ අවස්ථාවේ දී $y$ නම් මෝටර් රථයක් එම ලක්ෂ්‍යයෙන්ම $u$ ප්‍රවේගයෙන් ආරම්භ වී $2f$ ඒකාකාර මන්දනයක් යටතේ චලනය වේ. මෝටර් රථ යාන්තමින් එකිනෙක හමුවෙයි නම්, $2fT(u + fT) = u^2$ බව පෙන්වන්න.

12) a) දෛශික ආකලන නියමය භාවිතයෙන් $\underline{a}$ හා $\underline{b}$ දෛශික දෙකක ඓක්‍යය හා අන්තරය, අදාල සමාන්තරාස්‍රයේ විකර්ණ දෙක මගින් ලැබෙන බව පෙන්වන්න.
$\underline{a}$ හා $\underline{b}$ යනු ඒකක දෛශික දෙකක් වේ. ඒවායේ ඓක්‍යය ද ඒකක දෛශිකයක් වන පරිදි වෙයි නම් එම දෛශික දෙකේ අන්තරයේ විශාලත්වය $\sqrt{3}$ වන බව පෙන්වන්න.

b) $O$ මූලයට සාපේෂව $A, B, C$ ලක්ෂ්‍ය තුනක පිහිටුම් දෛශික පිළිවෙලින් $4\underline{i} + 2\underline{j}$ , $\underline{i} + \underline{j}$ හා $(k+1)\,\underline{i} + 6\underline{j}$ වේ. $A\hat{B}C = 45^0$ වන පරිදි $k\ (k < 0)$ හි අගය සොයන්න.

c) $OACB$ සමාන්තරාස්‍රයේ $D$ හා $E$ යනු පිළිවලින් $BD:DC = 1:2$ හා $AE : EC = 2:1$ වන පරිදි $BC$ හා $AC$ මත වන ලක්ෂ්‍ය දෙකක් වේ. $F$ යනු $OD$ හා $BE$ රේඛාවල ඡේදන ලක්ෂ්‍යය වේ. $O$ අනුබද්ධයෙන් $A$ හා $B$ හි පිහිටුම් දෛශික පිළිවෙලින් $\underline{a}$ හා $\underline{b}$ වෙයි. $\overrightarrow{OF} = \frac{3}{10}\left(\underline{a} + 3\underline{b}\right)$ බව පෙන්වන්න.
$P$ හිදී $OB$ හා $CF$ ඡේදනය වෙයි නම් $OP:PB$ අනුපාතය සොයන්න.

13) a) $OAB$ යනු පාදයක දිග $2a$ වන සමපාද ත්‍රිකෝණයකි. $C$ යනු $OA$ පාදයේ මධ්‍ය ලක්ෂ්‍ය වේ. $4P$ , $P$ සහ $P$ යන බල පිළිවෙලින් $OB, BA, AO$ පාද ඔස්සේ එම අක්ෂර අනුපිළිවලට ගන්නා දිශාව ඔස්සේ ක්‍රියාකරයි. $OA$ හා $OY$ ($CB$ ට සමාන්තරව) පිළිවෙලින් $x$ හා $y$ අක්ෂ ලෙස ගෙන සෑම බලයක්ම $x\underline{i} + y\underline{j}$ ආකාරයට ප්‍රකාශ කරන්න. මෙහි $\underline{i}$ හා $\underline{j}$ යනු පිළිවෙලින් $OX, OY$ ඔස්සේ වූ ඒකක දෛශික වේ.
එම බල පද්ධතිය $3P$ නම් තනි බලයකට ඌනනය කළ හැකි බව පෙන්වන්න.

එකී තනි බලය ත්‍රිකෝණයේ කේන්ද්‍රය ඔස්සේ ක්‍රියා කරන එකී සජාතීය සමාන්තර බලයකට හා $2\sqrt{3}\,ap$ විශාලත්වයෙන් යුත් බල යුග්මයකට ඌනනය කළ හැකි බව ද පෙන්වන්න.

b) $OABC$ ලක්ෂ්‍ය පිළිවෙලින් (0,0) (2,0) (2,1) , (0,1) වේ. P, Q, R බල පිළිවෙලින් OA, AB, BC පාද ඔස්සේ ක්‍රියා කරයි. මෙම බල පද්ධතියේ සම්ප්‍රයුක්ත බලය x+2y = 7 ඔස්සේ පිහිටයි නම්,

i) සම්ප්‍රයුක්ත බලය $P$ ඇසුරෙන් සොයන්න.

ii) සම්ප්‍රයුක්ත බලය $x + 2y = 9$ රේඛාවට සංක්‍රමණය කරන බල යුග්මයේ ඝූර්ණය සොයන්න.

14) a) $O$ අචල ලක්ෂ්‍යයක් අනුබද්ධයෙන් $A$ හා $B$ ලක්ෂ්‍ය දෙකෙහි පිහිටුම් දෛශික පිළිවෙලින් $\underline{a}$ හා $\underline{b}$ වෙයි. $C$ හා $D$ ලක්ෂ්‍ය පිළිවෙලින් $OB$ හා $OA$ මත පිහිටා ඇත්තේ $OC{:}CB = 5{:}2$ හා $OD{:}DA = 3{:}2$ වන පරිදිය. $AC$ හා $BD$ රේඛා $E$ හිදී ඡේදනය වේ. $\overrightarrow{OE} = \underline{b} + \lambda\left[\frac{3}{5}\,\underline{a} - \underline{b}\right]$ ලෙස ලිවිය හැකි බව පෙන්වන්න. මෙහි $\lambda$ නියතයකි.

$\overrightarrow{OE}$ සඳහා තවත් මෙවැනිම ප්‍රකාශනයක් ලබා ගන්න. එනයින් $E$ ලක්ෂ්‍යයේ පිහිටුම් දෛශිකය $\underline{a}$ හා $\underline{b}$ ඇසුරින් සොයන්න.

b) $O$ ලක්ෂ්‍යයක් අනුබන්ධයෙන් A, B, C ලක්ෂ්‍ය තුනක පිහිටුම් දෛශික පිළිවෙලින් $\underline{a}\,,\underline{b}$ හා $\underline{c}$ වෙයි. $BC$ රේඛාව මත $P$ ලක්ෂයය පිහිටා ඇති අතර $\overrightarrow{PC} = \frac{1}{10}\ \overrightarrow{BC}$ බව දී ඇත.

(i) $\overrightarrow{OP}$ දෛශිකය $\underline{a}$ හා $\underline{b}$ ඇසුරින් සොයන්න.

(ii) $AP$ හා $BC$ ලම්භක බව දී ඇත්නම්, $\left(9\underline{c} + \underline{b}\right).\left(\underline{c} - \underline{b}\right) = 10\underline{a}\,.\left(\underline{c} - \underline{b}\right)$ බව පෙන්වන්න.

b) ඉහත ප්‍රතිඵලය භාවිතයෙන් හෝ අන් අයුරකින් OA, OB හා OC අන්‍යොන්‍ය වශයෙන් ලම්භක වේ නම් $\left(3\underline{c} - \underline{b}\right).\left(3\,\underline{c} + \underline{b}\right) = 0$ වන බවද පෙන්වන්න.

15) a) $AB = 6a$ ද, $BC = 2\sqrt{3}\,a$ ද වන සෘජුකෝණාස්‍රයක $AB\,,BC\,,CD$ හා $DA$ පාදවල මධ්‍ය ලක්ෂ්‍ය පිළිවෙලින් $P, Q, R$ හා $S$ වේ. විශාලත්ව $15N\,,\lambda\,N\,,5N\,,10\,N\,,\ \mu\,N$ හා $30\sqrt{3}$ වන බල හයක්, අකුරුවල පටිපාටියෙන් දැක්වෙන දිශා ඔස්සේ පිළිවෙලින් $PQ, QR, RS, SP, AD$ හා $CD$ දිගේ ක්‍රියා කරයි. මෙම බල පද්ධතිය,

(i) සමතුලිත විය **නොහැකි** බවත්,

(ii) යුග්මයකට ඌණනය වේ නම්, එවිට $\lambda = -40$ සහ $\mu = 20$ බවත්,

(iii) $AD$ දිශාවට $10\,N$ බලයකට ඌනනය වේ නම්, එවිට $\lambda = -40$ සහ $\mu = 30$ බවත් පෙන්වන්න.

b) එකිනෙකට $1m$ දුරින් එකම මට්ටමේ වූ $A$ , $B$ ලක්ෂ්‍ය දෙකකට $2m$ දිග තන්තුවක් සම්බන්ධ කර ඇත. තන්තුවට රිංගවා ඇති $10N$ බර සුමට මුදුවක් කෙරෙහි ක්‍රියා කරන $P$ තිරස් බලයක් හේතුකොටගෙන එම මුදුව $B$ ට සිරස් ලෙස යටින් සමතුලිතතව ඇත. තන්තුවේ අතාතතියක් $P$ බලයේ විශාලත්වයත් සොයන්න.

16) a) $ABCD$ සෘජුකෝණාස්‍රයේ $AB = 4cm$ හා $BC = 3m$ වේ. විශාලත්ව නිව්ටන් 8,7,3,2,8,7 බල පිළිවලින් $\overrightarrow{AB}$ , $\overrightarrow{BC}$ , $\overrightarrow{CD}$ , $\overrightarrow{DA}$ , $\overrightarrow{AC}$ හා $\overrightarrow{DB}$ පාද ඔස්සේ ක්‍රියා කරයි. $R$ සම්ප්‍රයුක්තයේ තිරස් හා සිරස් සංරචක සොයන්න.

එනයින්, සමුප්‍රයුක්තයේ ක්‍රියා රේඛාව $AB$ කපන ස්ථානයට $A$ සිට දුර සොයන්න.

දැන් පද්ධතියට 9 $Nm$ වූ බල යුග්මයක් $ABCD$ අතට එකතු කරනු ලැබේ. නව සම්ප්‍රයුක්ත බලයේ ක්‍රියා රේඛාව $A$ සිට $2m$ ක් දුරින් $AB$ පාදය කපන බව පෙන්වන්න.

b) ලක්ෂ්‍යයක දී ක්‍රියා කරන බල තුනක සමතුලිතතාවය සඳහා ලාමි ප්‍රමේය ප්‍රකාශ කරන්න.

$ABCD$ යනු සැහැල්ලු අවිතන්‍ය තන්තුවකි. එය එකම මට්ටමේ පිහිටි $A$ හා $D$ යන අචල ලක්ෂ්‍ය දෙකකට ගැට ගසා ඇති අතර බර $W_1$ හා $W_2$ වූ අංශුන් පිළිවෙලින් $B$ හා $C$ ලක්ෂ්‍ය වලින් එල්ලා තිබේ. සමතුලිතතා පිහිටීමේ දී $C$ ට උඩින් $B$ තිබෙන අතර $AB, BC$ හා $CD$ තන්තු කොටස් සිරස සමඟ පිළිවෙලින් $\alpha, \beta, \gamma$ සුළු කෝණ සාදයි.

$\frac{W_1}{W_2} = \frac{\sin\gamma \ \sin(\beta - \alpha)}{\sin\alpha \ \sin(\beta + \gamma)}$ බව පෙන්වන්න.

17) a) $u$ ආරම්භක ප්‍රවේගයෙන් චලිතය අරඹන වස්තුවක් ඒකාකාර $a$ ත්වරණයකින් $t$ කාලයක් ගමන් කිරීමෙන් $s$ විස්ථාපනයක් සහිතව $v$ අවසාන ප්‍රවේගයක් ලබා ගනී. වස්තුවේ චලිතය සඳහා වූ ප්‍රවේග ලබා ගනී. වස්තුවේ චලිතය සඳහා වූ ප්‍රවේග කාල ප්‍රස්ථාරය භාතවියෙන්,
$v = u + at$ , $S = \left(\frac{u+v}{2}\right)t$ , $s = ut + \frac{1}{2}at^2$ හා $v^2 = u^2 + 2as$ යන ප්‍රගතික සමීකරණ ව්‍යුත්පන්න කරන්න.

b) වස්තුවක් $u\ ms^{-1}$ ප්‍රවේගයෙන් සිරස්ව ඉහළට ප්‍රක්ෂේපණය කරනු ලැබේ. ඊට $t$ කාලයකට පසුව එම ලක්ෂ්‍යයේම සිට එම ප්‍රවේගයෙන්ම තවත් සමාන අංශුවක් සිරස්ව ප්‍රක්ෂේපණය කරනු ලැබේ.

(i) අංශු දෙක එකිනෙක හමුවීමට ගතවන කාලය $\left(\frac{t}{2} + \frac{u}{g}\right)$බවත්,

(ii) අංශුන් හමුවන ලක්ෂ්‍යයට ආරම්භක ලක්ෂ්‍යයේ සිට ඇති සිරස් උස $\frac{4u^2 - g^2t^2}{8g}$ බවත් පෙන්වන්න.

c) ඒකාකාර කාල ප්‍රාන්තර වල දී කරාමයකින් ජල බිංදු කාන්දුවන බව නිරීක්ෂණය කරන ලදී, එක් ජල බිංදුවක් කරාමයෙන් මුදා හැරෙන මොහොතෙහි කලින් ගිළිහුණු ජල බිංදුව $\frac{1}{4}\ m$ දුරක් ඇද හැලී තිබුණි. ජල බිංදු දෙක අතර දුර $\frac{3}{4}\ m$ දක්වා වැඩිවන විට මුලින් වැටුණ ජල බිංදුවකොපමණ දුරක් පහළට ගමන් කොට තිබේද? (g = 10 $ms^{-2}$)